## ආබාධ සහිත පුද්ගලයන් පොදු ස්ථානවලට පිවිසීමේ පහසුකම:

# ප්‍රථම විගණන වාර්තාව 'මෙහෙවර පියස'දී ප්‍රකාශයට පත් කෙරේ

**චමීර ඇල්ලදෙණිය**

ආබාධ සහිත පුද්ගලයන්ට රජයේ ආයතන සහ පොදු ස්ථානවලට ප්‍රවේශ වීමේ පහසුකම් පිළිබඳව සිදු කළ ප්‍රථම විගණන වාර්තාව නාරාහේන්පිට කම්කරු දෙපාර්තමේන්තුවේ 'මෙහෙවර පියස' පරිශ්‍රයේදී ඊයේ (04) නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආබාධ සහිත වූවන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපති සුගත් වසන්ත ද සිල්වා මහතා විසින් මෙම වාර්තාව කම්කරු අමාත්‍යාංශයේ ලේකම් එස්.එම්. පියතිස්ස මහතා සහ කම්කරු කොමසාරිස් ජනරාල් නදීකා වටලියද්ද මහත්මිය වෙත නිල වශයෙන් පිළිගන්වනු ලැබුවාය.



මැතිවරණ පද්ධතිය සඳහා වූ ජාත්‍යන්තර පදනම (IFES) සහ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගය ඇතිව, ප්‍රවේශ පහසුකම් විගණන උපදේශක ටිකිරි කුමාර ජයවර්ධන මහතාගේ මෙහෙයවීමෙන් මෙම විගණනය සිදු කර ඇත. කම්කරු අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව පිහිටි 'මෙහෙවර පියස' නව ගොඩනැගිල්ලේ භෞතික ප්‍රවේශය පිළිබඳව මෙහිදී විශේෂ අවධානයක් යොමු කර තිබේ. මෙම විගණනයේදී ප්‍රවේශ පහසුකම් සම්බන්ධ ගැටලු 32ක් හඳුනාගෙන ඇත. ඒවා විසඳීම සඳහා රූපසටහන් හා නිදර්ශන සහිත නිර්දේශ 28ක් ඉදිරිපත් කර ඇත. රෝද පුටු භාවිත කරන්නන් ඇතුළු ශාරීරික ආබාධ සහිත පුද්ගලයන් මෙන්ම ශ්‍රවණාබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කර තිබේ. මෙම නිර්දේශ ක්ෂණික, මධ්‍යකාලීන සහ දිගුකාලීන වශයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

වාර්තාව පිළිගන්වමින් සුගත් වසන්ත ද සිල්වා මහතා ප්‍රකාශ කළේ, කම්කරු අමාත්‍ය අනිල් ජයන්ත මහතා සහ නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ මහතාගේ මඟපෙන්වීම යටතේ අමාත්‍යාංශය ගනු ලැබූ මෙම පියවර සමස්ත ආබාධිත ප්‍රජාව වෙනුවෙන් සිදු කළ සත්කාර්යයක් බවයි.

පොදු ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබේ. ඉදිරි අය-වැය මඟින්ද මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට අපේක්ෂා කරන බව අමාත්‍යාංශ ලේකම් එස්.එම්. පියතිස්ස මහතා මෙහිදී සඳහන් කළේය. මීට අමතරව, ඉදිකිරීම්කරුවන් දැනුවත් කිරීම, කාර්ය මණ්ඩලයට සංඥා භාෂා පුහුණුව ලබාදීම සහ කම්කරු නීති තුළ 'සාධාරණ නවාතැන්' (Reasonable Accommodation) මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා වී ඇත.

CamScanner